# වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

# 2014

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## (2014.01.01 - 2014.12.31 දක්වා)


වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය,

'ගොවිජන මන්දිරය',

අංක 80/5, රජමල්වත්ත පටුමග ,

බත්තරමුල්ල ,

# පටුන


| | |
|---|---|
| වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 7 |
| පාලන අංශය | 9 |
| සැලසුම් අංශය | 15 |
| සංවර්ධන අංශය | 17 |
| ගිණුම් අංශය | 20 |
| නීති අංශය | 22 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 23 |
| ශ්‍රී ලංකා වනජීවී භාරය | 43 |

# වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

## දැක්ම

" ජෛව විවිධත්වය හා වනජීවී උරුමයන් සුරැකි දේශයක් "


## මෙහෙවර

" එලදායී වනජීවී රක්ෂිත ජාලයක් පවත්වා ගෙන යාම තුළින්, මනා සහජීවනයක් සහිතව සියළුම සත්ත්ව විශේෂයන්ට හා මිනිසුන්ට ජීවත්වීමට අවකාශ සලසාදීම. "

## ප්‍රධාන කාර්යයන්

- 1937 අංක 02 දරණ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත ක්‍රියාත්මක කරවීම.
- අන්තර්ජාතික වනජීවී සම්මුතීන් ක්‍රියාත්මක කරවීම.
- වනජීවී උරුමයන් හා ජෛව විවිධත්වය සුරැකෙන අයුරින් මිනිසුන්ට හා අනෙකුත් සියළුම සත්ත්ව විශේෂයන්ට ජීවත්වීමේ අයිතිය සුරැකීම සඳහා වන ප්‍රතිපත්ති තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කරවීම.
- ජාතික උද්‍යාන සංවර්ධනය තුළින් පාරිසරික සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමට දායක වීම.
- වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මෙහි අඩංගු කාර්යයන් මාසිකව කාර්තුමය හා වාර්ෂිකව ඇගයීම, මෙහෙයවීම හා අධීක්ෂණය.
- වනජීවී භාරය හා වන සත්ත්ව සංරක්ෂණ අරමුදල සම්බන්ධ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය.

# අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු හා ආයතන



## පාලන අංශය

## හැඳින්වීම

මෙම අමාත්‍යාංශය සතුව පවතින වටිනාම සම්පත වන මානව සම්පත මනාව කළමනාකරණය කිරීම තුලින් අමාත්‍යාංශ අරමුණු ඉටු කරවා ගැනීම සඳහා අවශ්‍ය සහය ලබාදීම පාලන අංශය මගින් සිදු කරනු ලබයි..

## කාර්යභාරය

- අමාත්‍යාංශය තුළ සාමාන්‍ය පරිපාලනය හා විනය පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ගේ ආයතන කටයුතු සිදුකිරීම.
- දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු නිසියාකාරව සිදුකිරීමට අමාත්‍යාංශයෙන් අවශ්‍ය සහය ලබාදීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තු ප්‍රශ්න හා අමාත්‍ය මණ්ඩල සංදේශ වලට අදාළ කටයුතු සිදුකිරීම.
- අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- වනදිවි සැරිය පුවත්පත මුද්‍රණය සම්බන්ධයෙන් ලේක් හවුස් ආයතනය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## 2014.12. 31 දිනට ප්‍රගතිය

2013.01.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයකින් වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය පිහිටුවන ලද අතර මෙම අමාත්‍යාංශය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 81කි. 2014.12.31 දිනට සේවයේ නියුතු නිලධාරින් සංඛ්‍යාව 74කි.

- 2014.12.31 දිනට වැටුප් වර්ධක ලැබීම සඳහා හිමිකම් ලබා තිබූ නිලධාරීන් 52 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ගෙවා ඇත.
- කාර්යාල කාර්ය සහායක තනතුරු 4ක් සහ රියදුරු තනතුරු 4ක් සඳහා බඳවා ගැනීම් කරන ලදී.
- ඉංජිනේරු නිලධාරියෙකුගේ සේවය ස්ථිර කර ඇති අතර කළමනාකරණ සහකාර නිලධාරිනියකගේ, රියදුරු මහතකුගේ සහ කාර්යාල කාර්යය සහායක නිලධාරින් දෙදෙනෙකුගේ සේවය ස්ථිර කිරීම සඳහා යොමු කර ඇත.
- වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ පාලන අංශයට ලැබෙන සියළුම ලියාපදිංචි ලිපි හා සාමාන්‍ය ලිපි අප්‍රමාදව අදාළ ආයතන හා අංශ වලට යොමු කරනු ලබයි.
- ගරු ඇමතිතුමාගේ හා අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 12 දෙනකුගේ දූකරථන බිල්පත් හා පොදු දූරකථන දෙකෙහි බිල්පත් සහ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ දූරකථන 30ක පමණ බිල්පත් කඩිනමින් ගෙවීම් කටයුතු සිදුකර ඇත.
- නිලධාරීන්ගේ නිවාඩු විස්තර ඔවුන් වෙත ලබාදීඇත.
- 2014.03.19 දින වනජීවී සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කරන ලද යෝජනා 4ක් සඳහා පිළිතුරු ලබා දුන් අතර 2014.10.10 දින වනජීවී සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කරන ලද යෝජනා 18 ක් සඳහා පිළිතුරු ලබා දෙන ලදී.
- පාර්ලිමේන්තු ප්‍රශ්න 16ක් සඳහා පිළිතුරු ලබාදී ඇත.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.
- වනදිවි සැරිය මාසික පුවත්පත 2013 වසරේ මාර්තු මස ආරම්භ කළ අතර, 2014 ජූලි 11 දින පුවත්පතෙහි පළමු සංවත්සර පැන විසඳුම් තරගයේ ජයග්‍රාහී සිසු සිසුවියන්ට සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අනුග්‍රහයෙන් ත්‍යාග පිරිනමන ලදී. 2014 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මාසිකව වනදිවි සැරිය පුවත් පත නිකුත් කරන ලදී.
- වනදිවි සැරිය පුවත්පත අගෝස්තු මස සිට Hibright මුද්‍රණ කඩදාසි යටතේ ඉදිරි කලාපයන් නිකුත් කිරීමට තීරණයවූ අතර 2014 සැප්තැම්බර් මස සිට වසරකට කාර්තුමය වශයෙන් දමිළ පරිවර්තනයක් මුද්‍රණය කිරීමට කටයුතු කිරීම.

.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ පරිපාටි 14 අතුරින් 11ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත.
- පාලන අංශය තුළ පුස්තකාලයක් ආරම්භ කරන ලද අතර මෙම පුස්තකාලය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ආසියා පදනම හා පෞද්ගලික පොත් ප්‍රකාශන ආයතන වෙතින් සහ අධ්‍යාපන ග්‍රන්ථ උපදේශක මණ්ඩලය වෙතින් පොත් ලැබී ඇත. සතියේ සිකුරාදා දින කාර්යය මණ්ඩලයට පොත් ලබාදීම තුළින් ඔවුන්ගේ දැනුම් මට්ටම ඉහළ නැංවීමට හා කියවීමේ රුචිය පුළුල් කිරීමට කටයුතු කර ඇත.
- ගොවිජන මන්දිර පරිශ්‍රයේ වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට අදාළ ප්‍රදේශය තුළ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන සහමුලින්ම දුරලීම සඳහා මෙම අමාත්‍යාංශය මගින් ඩෙංගු මර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබාදෙන ලදී. වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට වෙන් කර ඇති ප්‍රදේශයේ අමාත්‍යාංශ නිලධාරීන් කණ්ඩායම් වශයෙන් සති දෙකකට වරක් ඒ සඳහා අදාළ භූමි ප්‍රදේශය පරීක්ෂාවට ලක්කිරීම හා ඩුන්ක්ස් බැක්ටීරියාව, කළුතෙල්, ජෛවීය මදුරු නාශකය BTI යෙදීම සඳහා යොමු කරන ලදී. 2014 වසර තුළ ඩෙංගු පරීක්ෂා කිරීම් මෙම අමාත්‍යාංශය විසින් වාර 32 ක් සිදුකර ඇති අතර නාරාහේන්පිට ස්ථාපිත කර ඇති ඩෙංගු මර්ධන ඒකකයට හා කෘෂිකර්ම අමාත්‍යාංශයට පිටපත් සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඩෙංගු මර්ධනය පිළිබඳව වාර්තාවක් මාසිකව ඉදිරිපත් කර ඇත.

## මානව සම්පත් සංවර්ධනය උදෙසා ලබා දුන් පුහුණුවීම්

පුහුණු කිරීම හා හැකියා වර්ධනය සඳහා 2014 වර්ෂයට අනුමත වූ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් දස ලක්ෂයක් (රු.1,000,000.00) වූ අතර 2014.12.31 වනවිට එයින් රු. 920,358.20 මුදලක් වැය කර විවිධ පුහුණු වැඩසටහන් හා වැඩමුළු සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී කරවීමට කටයුතු කර ඇත.

| පුහුණුවේ නම | පුහුණු ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. වැටුප් පරිවර්තනය පිළිබඳ දෙදින වැඩමුළුව | නිපුණතා සංවර්ධන අරමුදල | 03 |
| 2. 2014 වර්ෂයේ අයවැය බදු සංශෝධන යෝජනාවලිය පිරික්සීම සම්බන්ධ පුහුණුව | නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 3. සරප්වරයාගේ කාර්යභාරය හා වගකීම | නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 4. ප්‍රවාහන කළමනාකරණය | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 02 |
| 5. ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා කාර්යාල කාර්ය සහායක කාර්යභාරය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 03 |
| 6. ඉංග්‍රිසි භාෂාව සම්බන්ධ සහතිකපත් පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 03 |
| 7. වනජීවී සම්පත් සංරක්ෂණය පිළිබඳ ක්ෂේත්‍ර පුහුණු වැඩමුළුව | විල්පත්තු ජාතික උද්‍යානය | 40 |
| 8. මයික්‍රොසොෆ්ට් ඔෆිස් | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය | 02 |
| 9. ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ සහතික පත්‍ර පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල . | 02 |
| 10. ප්‍රවාහන කළමනාකරණය | නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 11. මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණුව | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 20 |

| පුහුණුවේ නම | පුහුණු ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 12. විනය පරීක්ෂණ පැවැත්වීම | නිපුණතා සංවර්ධන අරමුදල | 02 |
| 13. නවක කා.කා.ස. හා රියදුරු පුහුණුව | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 08 |
| 14. රාජ්‍ය කළමනාකරණ සහායක නිලධාරීන්ගේ වගකීම හා කාර්යභාරය | නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 15. රාජ්‍ය ප්‍රසම්පාදන පරිපාටිය | නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 16. පාරිසරික බලපෑම් තක්සේරු කිරීම පිළිබඳ පුහුණුව | ඉංජිනේරු ආයතනය | 01 |
| 17. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වැඩමුළුව | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී පුහුණු ආයතනය | 01 |
| 18. බදු පිළිබඳ පුහුණුව | ශ්‍රී ලංකා ගණකාධිකාරී තාක්ෂණික සංගමය | 01 |
| 19. අර්ධ කාලීන ශ්‍රී ලංකා පරිගණක නිපුණතා සහතික පාඨමාලාව | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 03 |
| 20. මු.රෙ. 104 පරීක්ෂණ පැවැත්වීම | නිපුණතා සංවර්ධන අරමුදල | 05 |
| 21. ආයතන සංග්‍රහය | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 13 |
| 22. වැටුප් පරිවර්තන | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 07 |
| 23. කාර්යාභිවර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 04 |
| 24. පාරිසරික බලපෑම් තක්සේරු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 |
| 25. මාදුරුඔය පුහුණු වැඩමුළුව | විශේෂ බලකා පුහුණු පාසල මාදුරුඔය | 20 |
| 26. Super Map GIS පුහුණු වැඩසටහන | Katak GIS Ltd | 03 |

| පුහුණුවේ නම | පුහුණු ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 27. වැටුප් පරිවර්තනය | නිපුණතා සංවර්ධන අරමුදල | 02 |
| 28. ගිණුම් ක්‍රමාණුකූලව නඩත්තු කිරීම | නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 29. කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | නිපුණතා සංවර්ධන අරමුදල | 05 |
| 30. මානව සම්පත් කළමණාකරනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | කොළඹ විශ්ව විද්‍යාලය | 01 |
| 31. බදු පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පී ආයතනය | 01 |
| 32. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වැඩමුළුව | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | 01 |

# සැලසුම් අංශය

## හැඳින්වීම

අමාත්‍යාංශයේ සංවර්ධන කාර්යයන් සැලසුම් කෙරෙන්නේ මෙම අංශය මගින්ය. ඒ අනුව ජාතික අවශ්‍යතාවන් හඳුනා ගනිමින් සංවර්ධන කටයුතු සැලසුම් කෙරෙන අතර එකී සැලසුම් අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුව හා ආයතනය මගින් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ළඟා කර ගැනීම සඳහාත් මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ඉදිරියේදී ළඟා කර ගත යුතු අරමුණු කරා මෙහෙයවමින් සැලසුම් කටයුතු වල නිරත වීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

## කාර්යභාරය

- අමාත්‍යාංශයට අදාළ සංවර්ධන සැලසුම් සකස් කිරීම.
- ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව හා ආයතනය සම්බන්ධීකරණය කරගනිමින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂිකව සමස්ත ප්‍රගතිය ලබාගැනීම හා තොරතුරු විමර්ශනය කර ප්‍රගති සමාලෝචන වාර්තා පිළියෙළ කිරීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීමට සහයවීම හා එම ආයතනය විසින් ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය හා මෙහෙයවීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවේ සංවර්ධන යෝජනා සැකසීමේදී අවශ්‍ය උපදෙස් ලබාදෙමින් එම යෝජනා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කිරීම.
- මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව ප්‍රගති සමාලෝචනය කිරීමට අවශ්‍ය කාර්යසාධන දර්ශක පිළියෙල කිරීම.
- රු.මි. 50ට වැඩි ව්‍යාපෘති වල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.
- අමාත්‍යාංශයේ අයවැය කාරක සභා අවස්ථාවේදී ලබාදීම සඳහා කාර්ය සාධන වාර්තා සැකසීම.
- වාර්ෂික කාර්යසාධන වාර්තා සැකසීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවල අවශ්‍යතාවය මත අවශ්‍ය වන තොරතුරු ලබාදීම.
- අමාත්‍යාංශයට අදාළ විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.

## 2014.12. 31 දිනට ප්‍රගතිය

- 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව හා ආයතනයේ කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.
- රු.මි. 50ට වැඩි ව්‍යාපෘති වල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයට යොමු කොට ඇත.
- අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාවේදී ලබාදෙන 2014 වර්ෂයේ ප්‍රගතිය හා ඉදිරි වර්ෂයේ වැඩසටහන් ඇතුළත් වාර්තාව සකස්කර ඉදිරිපත් කර ඇත.
- 2014 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ කටයුතු සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී.
- 2013 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකසා අවශ්‍ය ආයතන වෙත ලබාදී ඇත.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අවශ්‍ය තොරතුරු ලබාදී ඇත.

# සංවර්ධන අංශය

## හැඳින්වීම

මෙම අංශය මගින් වනජීවී සංවර්ධන කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම සහ අමාත්‍යාංශයේ නඩත්තු කටයුතු මනාව සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

## කාර්යභාරය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍යවන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- වනජීවී සම්පත් සංරක්ෂණය සම්බන්ධව අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන පැමිණිලි පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන වනජීවී විෂයට අදාළ මහජන පැමිණිලි විසඳීම සඳහා අදාළ ආයතන වෙත යොමු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම්, පුරාවිද්‍යා රක්ෂිත ආශ්‍රිත ගැටළු සහ රක්ෂිත තුළ පදිංචි මහජනතාවගේ ගැටළු පිළිබඳව කටයුතු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අත්පත් කර ගැනීම සහ අත්පත් කර ගනු ලබන ඉඩම් සඳහා වන්දි ලබා දීම නිර්දේශ කිරීම.
- ජාතික වනෝද්‍යාන තුළ සිදුකරන සංවර්ධන කටයුතු, විදුලි වැට ඉදි කිරීම, වනඅලි රැඳවුම් මධ්‍යස්ථාන ඉදිකිරීම, වාසස්ථාන සුපෝෂණය කිරීම යනාදී කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
- වනජීවී කටයුතු වලට අදාළව සහ මෙම අමාත්‍යාංශයේ විෂය කටයුතු වලට අදාළව වෙනත් අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- වන අලි තර්ජනයට ලක්වන ජනතාව උදෙසා සකස් කරන රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.
- වික්ටෝරියා,රන්දෙණිගල,රන්ටැඹේ අභය භූමි මායිම් නැවත සලකුණු කිරීමට අදාළ කටයුතු.
- හීලෑ අලි පැටවුන් සහ වෙනත් වනජීවී සතුන් සම්බන්ධ ඉල්ලීම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය
- වන අලි තර්ජන නිසා සිදුවන ජීවිත හා අනිකුත් හානි වෙනුවෙන් වන්දි ලබාදීමේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- වඳුරන් සහ රිලවුන් සම්බන්ධ ගැටළු නිරාකරණ කිරීමට අදාළ පර්යේෂණ හා නිර්දේශ ලබාදීම.
- අලි සංරක්ෂණය සම්බන්ධ කටයුතු.

- ජල සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳව අදාළ ආයතන සමඟ එක්ව කටයුතු කිරිම.
- ආපදා කළමනාකරණ සැලැස්ම සහ වැඩසටහන් ව්‍යාපෘතිය 2014 – 2018 අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරවීම.
- අමාත්‍යාංශයේ සියලුම නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සැකසීම, නිර්දේශ කිරීම, අධීක්ෂණය සහ ගෙවීම් කටයුතු සඳහා නිර්දේශ ලබා දීම.
- අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ සුළු නඩත්තු කටයුතු අග්‍රිම අත්තිකාරමක් ලබා ගෙන සිදු කිරීම.
- අමාත්‍යාංශය සතු වායුසමීකරණ යන්ත්‍ර, Fax යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර සහ පරිගණක යන්ත්‍ර වල නඩත්තු හා සේවා කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ තොරතුරු යාවත්කාලීන කිරීම.
- අමාත්‍යාංශයේ සියලුම අංශවලට Local Area Net Work පද්ධතිය ක්‍රියාත්මක කරවීම. අන්තර්ජාල පහසුකම් ලබා දීම.

## 2014. 12. 31 දිනට ප්‍රගතිය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව ලැබුණු මහජන පැමිණිලි 31ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන වනජීවී විෂයට අදාළ මහජන පැමිණිලි 289 ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා අදාළ ආයතන වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සම්බන්ධව පිටස්තර පුද්ගලයන් හා ආයතන අතර පවතින ගැටළු 7ක් නිරාකරණය කිරීමට කටයුතු සලසා ඇත.
- ජාතික උද්‍යාන තුල වැව් ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වැඩ සටහනක් ක්‍රියාත්මක කරවීම මගින් ඇස්තමේන්තු 15 ක් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.
- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය අවස්ථා වල අමාත්‍යාංශයේ සහය ලබා දී ඇත.
- වනජීවී සංරක්ෂණ විෂය සම්බන්ධව වෙනත් අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කර තිබූ කැබිනට් පත්‍රිකා 02 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- වන අලි තර්ජනයට ලක් වන ජනතාව උදෙසා සකස් කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, අයවැය දෙපාර්තමේන්තුව, කෘෂි රක්ෂණ මණ්ඩලය සමඟ සාකච්ඡා පවත්වමින් අදාළ කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

- ජල සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ අදාළ ආයතන මඟින් පවත් වනු ලබන රැස්වීම්, වැඩමුළු සහ ක්ෂේත්‍ර පරීක්ෂණ වලට සහභාගීවී ඇත.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 09 ක් නිම කර ඇත.
- වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.
- මෙම වර්ෂයේදී අමාත්‍යාංශයේ සියළුම නඩත්තු කටයුතු සඳහා වටිනාකම රු. 2,437,042.17 ක් වැය කර ඇති අතර ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම, ඉදිකිරීම් අධීක්ෂණය හා අදාළ ගෙවීම් කටයුතු සඳහා අනුමැතිය ලබා දීම් යනාදිය සිදු කර ඇත.

- අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය, ජල සැපයුම් පද්ධතිය, වැසිකිළි පද්ධතිය ඇතුළුව ඉතා කඩිනමින් සිදු කල යුතු සුළු නඩත්තු කටයුතු සඳහා රු.5375.00 වැය කර ඇත.

- මෙම අමාත්‍යාංශයේ කාර්යාල කාමර වල වායු සමීකරණ යන්ත්‍ර 23 ක් සවි කර ඇති අතර, ඒවා වසරකට තුන් වාරයක් සේවා කටයුතු සිදු කරනු ලබයි. සේවා ගිවිසුම් ගත වීම සඳහා මෙම වර්ෂය තුලදී රු: 154,633.92 ක් වැය කර ඇත. මීට අමතරව මෙම යන්ත්‍රවල අළුත්වැඩියා කටයුතු අවශ්‍ය අවස්ථා වල සිදු කර ඇත.ඒ සඳහා රු.33,986.40 මුදලක් වැය කර ඇත.

- Fax යන්ත්‍ර 11 ක් සේවා කටයුතු සඳහා 2014 වර්ෂයට රු. 62,014.40 මුදලක් මේ වන විට ගෙවා ඇත. වසරකට 4 වතාවක් සේවා කටයුතු ඉටු කරනු ලබයි.

- අමාත්‍යාංශයේ ඡායා පිටපත් යන්ත්‍ර 09ක සේවා ගිවිසුම් සඳහා 2014 වර්ෂයේ රු. 118,916.40 ක මුදලක් ගෙවා ඇත. වසරකට 4 වතාවක් සේවා කටයුතු සිදු කරනු ඇත.

- පරිගණක යන්ත්‍රවල අළුත්වැඩියා කටයුතු අවශ්‍ය අවස්ථා වල සිදු කරනු ලබයි.

- මාසිකව රු. 3,085.69 ක මුදලක් වැය කරමින් අමාත්‍යාංශ නිළධාරීන් සඳහා විද්‍යුත් ලිපිනයන් 15 ක් ලබා දෙන ලදී. මේ සඳහා වාර්ෂිකව රු. 37,028.28 ක මුදලක් දරනු ලබයි.

# ගිණුම් අංශය

## හැඳින්වීම

අමාත්‍යාංශයේ ගිණුම් අංශය ප්‍රධාන අංශ 2 කින් සමන්විත වේ. එනම් මුදල් අංශය සහ ගෙවීම් හා ප්‍රසම්පාදන අංශය ලෙසිනි. මුදල් අංශය, වාර්ෂික අයවැය ලේඛන පිළියෙල කිරීම, විසර්ජන ගිණුම පිළියෙල කිරීම, අක්මුදල් අවශ්‍යතා ලබාගැනීම හා භාණ්ඩාගාරය සමඟ අදාළ සම්බන්ධීකරණ කටයුතු ඉටුකරයි. ප්‍රසම්පාදන හා ගෙවීම් අංශය අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවත්නා ආයතනවල ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකිරීම, ඒ සම්බන්ධ අධීක්ෂණයන් සිදු කිරීම හා අමාත්‍යාංශයේ සියලුම ගෙවීම් කටයුතු සිදුකරනු ලබයි.

## කාර්යභාරය

- වාර්ෂික විසර්ජන පනතින් බලය ලැබූ වියදම් කළමනාකරණය කිරීම සඳහා මුදල් රෙගුලාසි, අණපනත්, චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කරමින් දෛනික මාසික හා වාර්ෂික ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාම.
- වත්කම් කළමනාකරණය
- වාර්ෂික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සැකසීම
- අමාත්‍යාංශයට අදාළ වැටුප්, ණය අත්තිකාරම්, පොදු තැන්පත් ඇතුළු සියළුම මූලධන හා පුනරාවර්තන ගෙවීම් කටයුතු ඉටු කිරීම හා වියදම් කළමනාකරණය කිරීම.
- අමාත්‍යාංශයෙහි හා අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රසම්පාදන කමිටු පත් කිරීම හා ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකිරීම හා අධීක්ෂණය.
- අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා ආයතන වලට අදාළ රාජ්‍ය ගිණුම් කාරක සභාව හා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා කටයුතු ඉටුකිරීම.
- අමාත්‍යාංශයෙහි මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල වාර්ෂික ගිණුම් හා වාර්තා අධීක්ෂණය
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙන් ණය ගෙවීම, ඒවා නිසි පරිදි අය කර ගැනීම, හා ඊට අදාළ ගිණුම් පවත්වා ගැනීම.

# 2014.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

## වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන
## අමාත්‍ය කාර්යාලය

| විස්තරය | 2014 ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | 2014.12.31 ට වියදම (රු.මි.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| | | | | |
| **පුනරාවර්තන වියදම්** | **27.01** | **28.89** | **28.09** | **97** |
| පුද්ගල පඩි නඩි | 9.20 | 9.19 | 8.53 | 93 |
| ගමන් වියදම් | 1.50 | 1.89 | 1.85 | 98 |
| සැපයීම් | 7.51 | 6.58 | 6.52 | 99 |
| නඩත්තු වියදම් | 4.55 | 4.97 | 4.95 | 100 |
| සේවා | 4.25 | 6.26 | 6.24 | 100 |
| **මූලධන වියදම්** | **5.40** | **14.50** | **11.43** | **79** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 2.40 | 2.40 | 2.3 | 96 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 3.00 | 12.10 | 9.13 | 75 |
| **මුළු වියදම** | **32.41** | **43.39** | **39.52** | **91** |

## වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන
## ව්‍යාපෘතිය 02 ආයතනික පරිපාලන සේවා

| විස්තරය | 2014 ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | 2014.12.31 ට වියදම (රු.මි.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| | | | | |
| **පුනරාවර්තන වියදම්** | **65.71** | **53.41** | **53.05** | 99 |
| පුද්ගල පඩි නඩි | 41.40 | 29.79 | 29.79 | 100 |
| ගමන් වියදම් | 1.30 | 1.30 | 1.22 | 94 |
| සැපයීම් | 8.61 | 9.03 | 9.00 | 100 |
| නඩත්තු වියදම් | 6.20 | 5.99 | 5.83 | 97 |
| සේවා | 7.20 | 6.83 | 6.75 | 99 |
| රාජ්‍ය ණය පොළී | 1.00 | 0.47 | 0.46 | 98 |
| **මූලධන වියදම්** | **8.95** | **8.95** | **7.66** | 86 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 2.95 | 3.4 | 3.15 | 93 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 5.00 | 4.55 | 3.59 | 79 |
| හැකියා වර්ධනය | 1.00 | 1.00 | 0.92 | 92 |
| **මුළු වියදම** | **74.66** | **62.36** | **60.71** | **97** |

# නීති අංශය

## කාර්යභාරය

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන සම්බන්ධව අමාත්‍යාංශය ඉටුකළ යුතු නීති කටයුතු අධීක්ෂණය මගින් ඉහළ කළමනාකාරිත්වයට සහාය වීම.

- 1937 අංක 07 දරණ වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (469 වන අධිකාරිය) ක්‍රියාත්මක කිරීම , අධීක්ෂණය හා එම පනත සඳහා අවශ්‍ය වන්නා වූ රෙගුලාසි, නියෝග සහ සංශෝධන සකස් කිරීම සඳහා උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

- විවිධ ශාක සහ සත්ත්ව වර්ග වලට ක්‍රියාකාරකම් පාලනය කිරීමෙහිලා රෙගුලාසි සම්පාදනය කිරීම .

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රමාද වී පවත්නා නීති කටයුතු සම්බන්ධව, අමාත්‍යාංශය වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය කර එම කටයුතු කඩිනමින් නිමකිරීමට කටයුතු කිරීම.

- අමාත්‍යාංශය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් පවත්නා නඩු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමග පවත්වනු ලබන උපදේශාත්මක සාකච්ඡා සඳහා සහභාගිවීම සහ අවශ්‍ය නිරීක්ෂණ සකස්කර ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කිරීම.

- තවද නීති උපදෙස් සහ අධිකරණ කටයුතු වලට අදාළ අනෙකුත් සියලුම නඩු කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- ජාතික රක්ෂිත භූමි, තහනම් අඩවි, ජාතික උද්‍යාන, ස්වාභාවික රක්ෂිත භූමි, වන පිවිසුම්, ආරක්ෂණ ස්ථාන, සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශ, සීමාන්තරික කලාප සහ අභය භූමි වල මායිම් නිවැරදිව හඳුනා ගැනීමට අදාළ කටයුතු සම්පාදනය කිරීමෙහිලා දෙපාර්තමේන්තුවට සහාය වීම.

- අමාත්‍යාංශයට සහ දෙපාර්තමේන්තුවට එරෙහිව ද දෙපාර්තමේන්තුව විසින් ද පවරන නඩු කටයුතු සඳහා උපදෙස් ලබා දෙමින් එම නඩු කටයුතු අධීක්ෂණය කිරීමේ කාර්යය සිදු කෙරේ.

- මහජනයා විසින් වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත ක්‍රියාත්මක බලධාරියාගේ කටයුතු සම්බන්ධව කරනු ලබන විවිධ පැමිණිලි විමර්ශනය කිරීමද අංශයේ කාර්යය භාරයකි. මහජනයා වෙත පනතේ කාර්යය සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## හැඳින්වීම



ශ්‍රී ලංකාවට ඉතා විශාල ජෛව විවිධත්වයක් උරුම වී තිබෙන ශාක සහ සත්ත්ව ප්‍රජාවන්ගෙන් ගහණ වූ පරිසර පද්ධතීන් ආරක්ෂා කරගැනීමෙහි මූලික වගකීම පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වේ. 1949 වර්ෂයේ දී ආරම්භ කරන ලද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් සංරක්ෂණය කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවෙහි සියලුම ප්‍රධාන ගංගාවන්ගේ මූලාශ්‍රයන් මෙන්ම කෘෂිකර්මාන්තය හා විදුලිය ජනනය සඳහා ජලය සපයන මහා පරිමාණ ජලාශයන් ඇතුළු ජලාශ 40 ක පෝෂක ප්‍රදේශයන් ආරක්ෂාව ලබන්නේ වනජීවී රක්ෂිත ජාලය තුළ ය. දිවයිනෙහි මුළු බිම් ප්‍රමාණයෙන් 13%ක් ඉක්මවන එම වනජීවී රක්ෂිත ජාලය කළමනාකරණය කිරීමෙහි වගකීම දරන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. එම වනජීවී රක්ෂිත ජාලය විවිධ සංරක්ෂණ මට්ටම් යටතේ ප්‍රකාශයට පත් කරන ලද වනජීවී රක්ෂිත වලින් සමන්විතය.

## දැක්ම

‘‘ වර්තමාන සහ අනාගත පරම්පරාවන් උදෙසා වනජීවී උරුමයන් සංරක්‍ෂණය කිරීම .’’

## මෙහෙවර

‘‘ සියල්ලන් හා එක්ව කටයුතු කරමින් වෘත්තීයමය කළමණාකාරිත්වයක් තුළින් වනජීවී උරුමය සංරක්‍ෂණය කිරීම .’’

# කාර්යභාරය

- සියලුම භූගෝලීය, දේශගුණික හා ජෛව කලාප තුළ වනජීවී සම්පත්වල ප්‍රමාණවත් නියැදි ආවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ වනජීවී රක්ෂිත ජාලය ස්ථාපිත කිරීම මගින් ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම.
- කෘෂිකර්මාන්තය හා ජල විදුලිය නිපදවීම සඳහා ජලය සපයන මහාපරිමාණ ජලාශයන්ගේ ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂාකරගැනීම, ආගමික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂාකර ගැනීම, ආවේණික හා දුලබ වනජීවී විශේෂයන් ආරක්ෂාකර ගැනීම, සුවිශේෂී පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගැනීම වැනි විශේෂිත අරමුණු ඇති වනජීවී රක්ෂිත ප්‍රකාශයට පත් කර වනජීවී රක්ෂිත ජාලය තුළ නිසි ලෙස කළමනාකරණය කිරීම.
- වඳවීමේ තර්ජනයට ලක්ව සිටින දේශීය වනජීවී විශේෂයන් සංරක්ෂණය සඳහා සුදුසු ක්‍රමවේදයන් භාවිත කරමින් විශේෂ ව්‍යාපෘතීන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මඟින් එම විශේෂයන් ගේ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.
- වනජීවී රක්ෂිතවලින් බැහැර ප්‍රදේශවල ආරක්ෂිත වනජීවී විශේෂයන් ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- තත්කාලීනව බලපවත්නා ජාතික වනජීවී ප්‍රතිපත්තිය හා නීතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තබා ඇති වනජීවී සංරක්ෂණය හා අදාළ, වඳවීමේ තර්ජනයට ලක් වූ ජීවී විශේෂයන් ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES), ජාත්‍යන්තර වැදගත්කමක් ඇති තෙත් බිම් පිළිබඳ සම්මුතිය (Ramsar) හා සංක්‍රමණික වන සත්ත්ව විශේෂයන් ගේ සංරක්ෂණය පිළිබඳ සම්මුතිය (CMS - Bonn) යන ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ලත් අධිකාරි බලය අනුව කටයුතු කිරීම.
- වනජීවී රක්ෂිත ආශ්‍රිතව පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය මඟින් ජාතික ආර්ථිකයට එයින් ලබාදෙන දායකත්වය ප්‍රශස්ත තලයක පවත්වා ගැනීම.
- වනජීවී සම්පත්වල සංරක්ෂණය හා විද්‍යාත්මක කළමනාකරණයක් සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු රැස්කර ගැනීමට පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය.
- ස්වභාව සම්පත් සංරක්ෂණය පරමාර්ථය කොටගත් වෙනත් ආයතන සමඟ අන්‍යෝන්‍ය අවබෝධය හා සහයෝගය වර්ධනය කර ගනිමින් සංරක්ෂණ ක්‍රියාදාමය ශක්තිමත් කර ගැනීම.
- සාමාන්‍ය මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා වෙනත් කණ්ඩායම් අතර වනජීවී සංරක්ෂණ කටයුතු ව්‍යාප්ත කිරීමෙන් ඔවුන්ගේ දායකත්වය ඊට නොඅඩුව ලබා ගැනීම ඉලක්ක කර ගත් වනජීවී සංරක්ෂණ අධ්‍යාපනික වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම.
- වනජීවී රක්ෂිත තුළ ස්වභාව සම්පත් මත ඒ අවට පදිංචි ජනතාව ගේ යැපීම අවම කර ගැනීම ඉලක්ක කොටගත් සමාජ ආර්ථික සංවර්ධන වැඩ සටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

# සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

## 1. විදුලි වැටවල් ඉදි කිරීම

**අරමුණු**

- අලි-මිනිස් ගැටුම අවම කිරීම
- අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා ක්‍රමෝපායන් සංවර්ධනය සහ හැකියා වර්ධනය.





| | | | |
|---|---|---|---|
| **2014 වෙන්කළ ප්‍රතිපාදන** | **-** | **රු.මි.** | **250.00** |
| **මූල්‍ය ප්‍රගතිය** | **-** | **රු.මි.** | **195.34** |

**භෞතික ප්‍රගතිය**

- වන අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික සැලැස්ම සකස් කර අවසන් කර ඇත.
- කි.මී. 300ක් දිග විදුලි වැටවල් සඳහා උපකරණ මිලදී ගෙන අවසන් කර ඇත.
- තවත් කි.මී. 547ක් දිග විදුලි වැටවල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට භාරදී ඉන් කි.මී. 104ක් දිග විදුලි වැට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර ඉතිරිය තවදුරටත් සිදු කරමින් පවතී. (විදුලි වැට අවට මාර්ගය එළි කිරීම 50%ක් අවසන් කර ඇත.)

## 2. හොරොව්පතාන අලි සංරක්ෂණ උද්‍යානය ඉදිකිරීම

ගම් වදින කරදරකාරි වන අලි, වන අලි සංරක්ෂණ උද්‍යානවලට මුදා හැරීම මගින් අලි-මිනිස් ගැටුම අවම කිරිමේ මූලික අරමුණින් 2012 වසරේ ඒකාබද්ධ අරමුදලේ මුදල් ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය.

**අරමුණු**

- අලි-මිනිස් ගැටුම පවතින ප්‍රදේශවල සමාජ-ආර්ථික හානි අවම කිරීම
- වන අලි සංරක්ෂණ උද්‍යාන හරහා පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම
- වන අලි සංරක්ෂණ උද්‍යාන හරහා ප්‍රදේශයේ ජනතාවට ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීම

**2014 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 30.00**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 24.21**

**සමස්ත භෞතික ප්‍රගතිය (2012 - 2014)**

- කි.මී 15ක් දිග ද්විත්ව විදුලිවැට ඉදි කිරීම සම්පූර්ණ කර ඇත.
- විශේෂයෙන් සැලසුම් කරන ලද විදුලි වැට ඉදිකර අවසන් කර ඇති අතර ඒ සඳහා කොන්ක්‍රීට් කණු 2,098ක් ඉදිකර සිටුවන ලදී.
- සපත්තු පාලම් 93ක් සාදා අවසන් කර ඇත. සපත්තු පාලම් 28 ක් සාදමින් පවතී.
- වැව් 03 ක ඉදිකිරීම් අවසන් කර ඇත.
- කාර්යාල සහ නිල නිවාස ගොඩනැගිලි 2ක ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.





## 3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව බල ගැන්වීම

වනජීවී ක්ෂේත්‍ර කටයුතු වලදී කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ලබාදීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වාහන මිලදී ගැනීමට ඉතිහාසයේ ප්‍රථම වරට රු.මි.200ක විශාල මුදලක් වෙන් කර ඇත. මේ යටතේ ඩබල් කැබ් රථ 40ක් හා සින්ගල් කැබ් රථ 30ක් මිලදී ගෙන වනජීවී කලාප සඳහා බෙදා හරින ලදී

**2014 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 200.00**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 150.19**

## 4. රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම

**2014 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 150.0**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 88.05**

**භෞතික ප්‍රගතිය**

- රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය යටතේ හෙක්ටාර් 593ක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, හෙක්ටාර් 54ක තෘණ භූමි නඩත්තු සිදු කිරීම, හෙක්ටාර් 231ක යටි පඳුරු ඉවත් කිරීම, කි.මී.117ක ගිණි පටි නඩත්තු කිරීම සහ වැව් 02ක අළුත්වැඩියා කටයුතු සහ කොන්ක්‍රීට් වලවල් 16ක් ඉදිකිරීම අවසන් කර ඇත.
- යාල ජාතික උද්‍යානය සඳහා සූර්ය ජල පොම්ප 2ක් සවිකර අඩි 13,600ක් දුරට ජල නල සවිකර ජලය සපයා ඇත. මීට අමතරව නියං සමයේ යාල උද්‍යානයට අවශ්‍ය ජල පොම්ප කිරීම සඳහා ඩීසල් පොම්ප 2ක් හා ජල නල මිලදී ගෙන ඇත.
- විල්පත්තු ජාතික උද්‍යානය සඳහා සූර්ය ජල පොම්ප 1ක් සවිකර කි.මී. 20ක් දුරට ජල නල සවිකර ජලය සපයා ඇත.
- කුමන සහ හොරොව්පතාන ජාතික උද්‍යානය සඳහා සූර්ය ජල පොම්ප මිලදී ගෙන සවි කර ඇත.
- කුමන ජාතික උද්‍යානය සඳහා සූර්ය ජල පොම්ප සවිකර අඩි 17,712 දුරට නල මාර්ගය සවිකර ඇත.
- නියං සමයේ වනජීවී රක්ෂිතවල දියවලවල් සඳහා ජලය පොම්ප කිරීම සහ බව්සර් මගින් ජලය සපයා ඇත.
- යාල, කුමණ සහ ඩෙල්ෆ් අශ්ව සංරක්ෂණ කලාපයේ භූගත ජල සමීක්ෂණය සිදු කර ඇත.
- තෘණභූමි නඩත්තු කටයුතු සඳහා තණකොළ කපන යන්ත්‍ර 20ක් මිලදී ගැනීම සහ ට්‍රැක්ටර් සඳහා සවිකරන තණකොළ කපන යන්ත්‍ර 2ක් මිලදී ගෙන ඇත.
- බූන්දල, කුමණ සහ කවුඩුල්ල ජාතික උද්‍යාන සඳහා සූර්ය ජල පොම්ප 5ක් මිලදී ගන්නා ලදී.

## 5. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන

2014 ප්‍රතිපාදන මත වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ අරමුදල් තුළින් දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ජාතික වන උද්‍යාන තුළ පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම
- වනජීවී රක්ෂිත ජාලය තුළ පරිපාලන සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- වනජීවී රක්ෂිත ජාලය පුළුල් කිරීම
- තොරතුරු සන්නිවේදන ජාලය ප්‍රවර්ධනය කිරීම

**2014 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 2.00**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 1.74**

**භෞතික ප්‍රගතිය**

- කුරුණෑගල වයඹ විශ්ව විද්‍යාලයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සාර්ථක ලෙස අවසන් කිරීම




## 6. මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ සිදුකරන වනජීවී සංරක්ෂණ කටයුතු

මොරගහකන්ද-කළුගග ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ 2008 වසරේ සිට වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව මගින් කළු ගඟ ගංගාධාර ප්‍රදේශයේ පහත අරමුණු උදෙසා වනජීවී සංරක්ෂණ කටයුතු ක්‍රියාවට නංවනු ලබයි.

**අරමුණු**

- කළුගඟ හා යෝජිත මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව ප්‍රේරක කලාපයක් ප්‍රකාශයට පත් කිරීම සහ එහි මිනිස් ක්‍රියාකාරකම් අවම කිරීම.
- ඉහත ප්‍රදේශයේ මිනිස් වනජීවී ගැටුම අවම කිරීම සඳහා වනජීවී බාධක පිහිටුවීම. (විදුලි වැටවල්, අගල් කැපීම ආදිය)
- අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ව්‍යාප්තියට යටත් වන ප්‍රදේශයේ වනජීවී වාසස්ථාන දියුණු කිරීම
- ව්‍යාප්ති ප්‍රදේශය අයත් වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම.
- ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිතව වනජීවි රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

**2014 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 49.94**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 31.44**

**භෞතික ප්‍රගතිය**

- කවුඩුල්ල ජාතික උද්‍යානයේ අක්කර 55ක යටි රෝපණ ඉවත් කරනු ලැබීය.
- කි.මී. 30ක් දිග විදුලි වැට ඉදිකර අවසන් කර ඇත.
- කි.මී. 72 ක් දිග විදුලි වැට සඳහා උපකරණ මිලදී ගැනීම අවසන් කර ඇත.

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය - 2014.12.31 දිනට**

| අනු අංක | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **1.** | **රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිත කිරීම.**<br><br>මධුපාර අභයභූමියේ දැන්වීම් පුවරුව<br><br>වුණුඩිකුළම් අභයභූමියේ දැන්වීම් පුවරුව | **1.40** | **0.37** | • වුන්ඩිකුළම් අභයභූමියේ ජෛව විද්‍යාත්මක තොරතුරු සමීක්ෂණයේ පළමු පියවර හා දෙවන පියවර අවසන් කර ඇත. |
| **2.** | **පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය.**<br><br>මින්නේරිය ජාතික උද්‍යානය<br><br>වෙහෙරගල සංචාරක බංගලාව | **7.0** | **6.69** | • වුණ්ඩිකුළම් වනජීවී සංචාරක බංගලාව මහජනතාව සඳහා විවෘත කරන ලදී.<br>• නිල්ගල අඩු වියදම් වනජීවී සංචාරක බංගලාවේ ඉදි කිරීම් අවසන් කර ඇත.<br>• සංචාරක බංගලා 4ක පහසුකම් වැඩිදියුණු කර ඇත.<br>• කඳවුරු බිම් 2ක් ඉදිකිරීම සම්පූර්ණ කර ඇත.<br>• ගල්ඔය ජාතික උද්‍යානය සඳහා ස්වාභාවික මං පෙතක්, විවේක ස්ථානයක් සහ වැසිකිළි 02ක් ඉදි කර අවසන් කර ඇත.<br>• අන්තර්ජාලය මගින් වනජීවී සංචාරක බංගලා වෙන් කිරීමේ ව්‍යාපෘතිය අවසන් කර ඇත. |

| අනු අංක | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 3. | **ජනවිහිදුම්කරණ වැඩසටහන.**<br><br>අත්කම් නිෂ්පාදන ප්‍රදර්ශනය<br><br>ප්‍රජා පාදක සංවිධාන මගින ක්ෂුද්‍ර සැලසුම් සකස් කිරීම | **4.0**<br>**සංශෝධිත**<br>**3.94** | **3.94** | • රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ සහභාගීත්වයෙන් ශ්‍රමදාන වැඩසටහන් 04ක්, ප්‍රජා මූල සංවිධානයන්හී ප්‍රගති සමාලෝචනය කිරීමේ වැඩසටහන් 04ක් සහ ස්වයං රැකියා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන් 11ක් පවත්වා අවසන් කර ඇත.<br>• ගල්ඔය ජාතික උද්‍යානය අවට ස්වාරක්ෂක කලාපයේ කි.මී. 79ක් දිග මාර්ග අළුත්වැඩියා කිරීම. මහනිකවැව ගම්මානය සඳහා වතුර ටැංකි 60ක් ලබාදීම .<br>• කොටවෙහෙර මංකඩ රාජමහා විහාරයේ වහලය සඳහා ඇස්බැස්ටෝස් තහඩු ලබාදීම.<br>• ඉන්ධන කාර්යක්ෂම උදුන් 25ක් බෙදාදීම. වස්ගමුව හා මින්නේරිය ජාතික උද්‍යාන අවට කි.මී. 7ක් දිග ජීව වැටවල් නඩත්තු කිරීම අවසන් කර ඇත. |
| 4 | **තර්ජනයට ලක් වූ ජීවීන් සංරක්ෂණය.**<br><br>වනජීවීන්ට ප්‍රතිකාර කිරීම<br><br>උඩවලව ඇත් අතුරු සෙවන | **2.0**<br>**සංශෝධිත**<br>**2.18** | **2.18** | • සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා නිර්වින්දන තුවක්කු 04ක් මිල දී ගනු ලැබීය.<br>• පණ්ඩුලගම පශු වෛද්‍ය කාර්යාලය සඳහා ශල්‍යකර්ම සිදු කිරීම සඳහා මේසක් ඉදි කිරීම.<br>• අනාථ සහ විවිධ අනතුරුවලට පත් වූ සතුන්ට ප්‍රතිකාර කිරීම සහ ඔවුන් ස්වාභාවික පරිසරයට මුදාහරින තෙක් රඳවා තබා ගැනීම සඳහා විවිධ ප්‍රමාණයේ සත්ත්ව කූඩු 29ක් සකසා ඇත. |

| අනු අංක | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 5 | **තොරතුරු හා සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම.**   ගුවන් විදුලි සන්නිවේදන ජාලය නඩත්තු කිරිම | **2.0 සංශෝධිත 3.14** | **3.14** | • ප්‍රධාන කාර්යාලය සහ ක්ෂේත්‍ර කාර්යාලවල ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියේ සහ පරිගණක ගත තොරතුරු සන්නිවේදන පද්ධතිවල නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී.<br>• WILDLANKA -2014 පර්යේෂණ සගරාවෙහි පිටපත් 200 ක් සහ වනදිවි තෙත් බිම් සගරාවෙහි පිටපත් 2000 ක් මුද්‍රණය කර බෙදා හරින ලදී.WILDLANKA පර්යේෂණ සම්මන්ත්‍රණය පදනම් ආයතනයේදී සාර්ථකව පවත්වන ලදී.<br>• හෝටන්තැන්න ජා.උ තොටුපලකන්ද නව ගුවන් විදුලි සන්නිවේදන කුළුණ ස්ථාපිත කරනු ලැබීය. |
| **6.** | **රක්ෂිත ප්‍රදේශ වල නව මාර්ග ඉදිකිරිම ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම**    | **23.1** | **10.13** | • ගල්ඔය, ලුණුගම්වෙහෙර, යාල, ලාහුගල, කුමණ, ජාතික උද්‍යාන වල කි.මී. 72ක් දිග මාර්ග සහ සපත්තු පාලම් 05 ක් අළුතින් ඉදි කර ඇත.<br>• යාල ජාතික උද්‍යානයේ කි.මි.34ක් දිග මාර්ග ප්‍රතිසංස්කරණය කර ඇත. |

| අනු අංක | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **7** | **රක්ෂිත ප්‍රදේශ වල ජල ප්‍රභවයන් වැඩි දියුණු කිරීම.**<br><br><br>විල්පත්තුව ජා.උ. යේ වැව් ප්‍රතිසංස්කරණය | **1.5** | 0.18 | • කවුඩුල්ල ජාතික උද්‍යානයේ වැවක් ප්‍රතිසංස්කරණය සිදු කර ඇත. |
| **8** | **ගොඩනැගිලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය**<br><br>වව්නියාව වනජීවී පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරිම | **54.0** | **18.32** | • රක්ෂිත ප්‍රදේශවල පරිපාලන ගොඩනැගිලි සහ නිල නිවාස ඇතුළුව ගොඩනැගිලි 18 ක ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇත.<br>• විදුලි සැපයුම පද්ධති 2ක් සහ නල ළිදක් පිළිසකර කිරීම සිදු කරන ලදී. |
| **9** | **ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම**<br><br>වනජීවී සංචාරක නිවාසය සඳහා මිල දී ගත් ගෘහ භාණ්ඩ | **18.5** | **17.74** | • වනජීවී සංචාරක බංගලා 07ක් සඳහා ගෘහ භාණ්ඩ සහ මුළු තැන්ගෙයි උපකරණ මිල දී ගැනීම අවසන් කර ඇත.<br>• වනජීවී කාර්යාල සඳහා පරිගණක 40ක්,UPS 45ක්, ලැප්ටොප් 11ක්, මුද්‍රණ යන්ත්‍ර 23ක්, ෆැක්ස් මැෂින් 13ක්, ලිපිකරු මේස 59ක්, ඡායාපිටපත් යන්ත්‍ර 11 ක් මිලදී ගැනීම සිදු කර ඇත. |

| අනු අංක | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **10.** | **යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම** | **12<br>සංශෝධිත<br>12.31** | **12.31** | • ප්‍රධාන කාර්යාලය සඳහා ඇමතුම් උපකරණ (Public Address system) කට්ටලයක් සහ වායු සමීකරණ යන්ත්‍ර 5ක් සවි කිරීම ජෙනරේටර් 10ක් වනජීවී කලාප කාර්යාල සඳහා වතුර මෝටර් 03ක් මිල දී ගන්නා ලදී. |
| **11.** | වාහන අළුත්වැඩියාව | **8** | **7.97** | • දෙපාර්තමේන්තුවේ සහ කේෂත්‍ර කාර්යාලවල වාහන 13ක් අළුත්වැඩියා කර අවසන් කර ඇත. |
| **12.** | **රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම**<br><br> | **39.65** | **28.90** | • වනජීවී රක්ෂිත පිළිබඳව සහ ජීවායේ සංරක්ෂණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීම් පුවරු 183ක් අලුත්වැඩියා කර අවසන් කර ඇත.<br>• රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම සඳහා මායිම් කණු 2,283ක් සකසා අවසන් කර ඇත.<br>• කි.මී. 152ක් දිග රක්ෂිත මායිම් සළකුණු කිරීම සඳහා මායිම් කණු සිටුවා අවසන් කර ඇත.<br>• වික්ටෝරියා, රන්දෙණිගල සහ රංටැඹේ අභයභූමියේ මායිම් නැවත විවෘත කිරීම මිනුම්දෝරු දෙපාර්තමේන්තුව මගින් සිදු කර ඇත. මායිම් සංශෝධනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු කරමින් පවතී. |

| අනු අංක | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **13** | **පුහුණු හා පර්යේෂණ කටයුතු**<br><br><br>ගිනි අවි පුහුණුව පිළිබඳව පුහුණු පාඨමාලාව- මහඔය පොලිස් විශේෂ කාර්ය බලකාය | **1.30** | **1.48** | • පර්යේෂණ කමිටු 03ක් පවත්වා ඇති අතර එහිදී කමිටු සමාජිකයන් විසින් නිර්දේශ කර බාහිර පර්යේෂකයන්ගේ පර්යේෂණ ව්‍යපෘති සඳහා අනුමැතිය මේ වනවිට ලබා දී ඇත. වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික සැලස්ම පිළියෙල කර අවසන් කර ඇත.<br>• දෙපාර්තමේන්තු නිලධාරින්ගේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවත් වූ අතර දෙපාර්තමේන්තු පර්යේෂණ 16ක් සිදු කර ඇත.<br>• පක්ෂීන්ට මුදු පැළඳවීමේ ජාතික වැඩසටහනේ සැසි 02ක් බුන්දල ජාතික උද්‍යානයේ දී පවත්වා අවසන් කර ඇත. |
| **14.** | **සංරක්ෂණ අධ්‍යයනය හා විවරණ හා පුහුණු කටයුතු** | **4.70**<br>**සංශෝධිත**<br>**6.0** | **6.0** | • ලෝක පරිසර දිනය, ජෛව විවිධත්ව දිනය, හා තෙත් බිම් දින සැමරීම සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් 03ක් වනජීවී කලාප 03ක් ආවරණය වන පරිදි පැවත්වීය.<br>• පොසොන් සහ ඇසළ උත්සව වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් වනජීවී කලාප 02ක් ආවරණය වන පරිදි පැවත් වීය.<br>• පාසල් ළමුන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළුව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 96ක් පවත්වා අවසන් කර ඇත. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **14.** | **සංරක්ෂණ අධ්‍යයනය හා විවරණ හා පුහුණු කටයුතු** | | | • සියළු වනජීවී කලාප ආවරණය වන පරිදි ප්‍රදර්ශන වැඩසටහන් 18ක් පැවත්විය.<br>• පාසල් සිසුන් අතර වනජීවී මිතුරුකම වැඩසටහනක් ආරම්භකර පාසල් සිසුන්ගේ අඛණ්ඩ දායකත්වය වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීම සිදු කරමින් පවතී.ඒ අනුව ආරම්භක වැඩසටහන් 04ක් පවත්වා ඇත.<br>• වනජීවී සෞඛ්‍ය කළමනාකරණ සහ සන්නිවේදන උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් 05 පවත්වා ඇති අතර නවක කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් සහ මූල්‍ය හා කාර්යාල කළමනාකරණ පුහුණු වැඩසටහනක් ද පැවත් විය.<br>• වනජීවීන් පිළිබඳව පත්‍රිකා 02ක් සහ පෝස්ටර් 02 සිංහල හා දෙමළ මාධ්‍යයෙන් මුද්‍රණය සිදු වෙමින් පවතී.<br>• වනන්තරේ කතන්දරේ වැඩසටහන් 29ක් ගුවන් විදුලි සංස්ථාව මගින් ප්‍රචාරය කරන ලද අතර වනජීවී වාර්තා වැඩසටහන් 04ක් නිෂ්පාදනය කිරීම සහ වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය මගින් පළ කරන “වනදිවි සැරිය“ නම් පුවත්පතේ කලාප 12ක් සහ දෙමළ පුවත්පතේ කලාප 02ක් මුද්‍රණය කර නිකුත් කරන ලදී. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | • වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වසර 65ක් පිරීම නිමිත්තෙන් සර්ව රාත්‍රික පිරිත් දේශනයක් 2014.09.25 දින උත්සවයක් 2014.10.01 දිනයන්හිදී පවත්වනු ලදී.<br>• පුස්තකාලය සඳහා නව පොත් මිලදී ගැනීම සිදු කරන ලදී. |
| **15.** | **ආරක්ෂාව හා නීතිය ක්‍රියාත්මක කිරීම.**<br><br><br>වනජීවී නිලධාරින් මුර සංචාරයක් අතර මග... | **6.0** | **4.85** | • ගිණි අවි සඳහා පතොරම් 5,000 ක් මිල දී ගැනීම අවසන් කරන ලදී.<br>• ගිණි අවි භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහනක්, සන්නිවේදන උපකරණ භාවිතය පුහුණු වැඩසටහන් 01ක් සහ වනජීවී නීතිය හා උසාවි කාර්යය පටිපාටිය, පිළිබඳව දැනුවත් කිරිමේ වැඩසටහන් 02ක් පවත්වනු ලැබීය.<br>• GPS හා චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් නීතිය ක්‍රියාත්මක කිරිම පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් 50ක් දැනුවත් කිරීම සඳහා වැඩමුළු 02 පවත්වන ලදී, |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **16.** | **ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම.**  ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය - ගිරිතලේ | **8.0** | **7.64** | • වනජීවී කළමනාකරණය පිළිබඳ කණිෂ්ඨ සහතික පත්‍ර පාඨමාලාවක් ගිරිතලේ ජාතික වනජීවී පුහුණු හා පර්යේෂණ කේන්ද්‍රයේදී වනජීවී නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා පවත්වනු ලැබීය.<br>• රාජ්‍ය නිලධාරින් සහ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ කෙටිකාලීන වැඩසටහන් 08ක් පවත්වනු ලැබීය. |

## වනජීවී සංරක්ෂණ අරමුදල

වනජීවී සංරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇත්තේ වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේය. මෙම අරමුදලේ අරමුණ වන්නේ වනජීවී සංචාරක කටයුතු වලින් ලැබෙන ආදායම් වලින් කොටසක් වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා යොදාගැනීමය. මෙම අරමුදලේ ආදායම් ලෙස සංචාරක කටයුතු වලින් ලැබෙන ආදායමින් කොටසක්, වනජීවී අපරාධ වලට එරෙහි නීතිමය කටයුතු වලින් ලැබෙන දඩ මුදල්, දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන වෙනත් සේවා වලින් ලැබෙන ආදයම් හා පරිත්‍යාග ද ඇතුළත් වේ.

## 2014 වසරේ වනජීවී සංරක්ෂණ අරමුදලේ ප්‍රගතිය

| මුල්‍ය ප්‍රභවය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු.මි.) | (%) |
|---|---|---|---|
| වනජීවී සංරක්ෂණ අරමුදල | 569.0 | 564.0 | 99 |

### 2014 වසරේ ජාතික උද්‍යාන වලින් ලද ආදායම

| මාසය | ආදායම (රු.) |
|---|---|
| ජනවාරි | 129,283,952.94 |
| පෙබරවාරි | 146,264,821.71 |
| මාර්තු | 119,708,412.84 |
| අප්‍රේල් | 99,702,207.23 |
| මැයි | 49,164,050.45 |
| ජූනි | 48,739,302.98 |
| ජූලි | 123,657,437.46 |
| අගෝස්තු | 173,207,742.26 |
| සැප්තැම්බර් | 73,303,436.90 |
| ඔක්තෝබර් | 80,932,090.49 |
| නොවැම්බර් | 89,755,023.14 |
| දෙසැම්බර් | 96,638,769.57 |
| **එකතුව** | **1,230,357,247.97** |

### 2014 වසරේ ජාතික උද්‍යානවලට සංචාරකයින්ගේ පැමිණීම

| ජාතික උද්‍යානය | දේශීය | විදේශීය |
|---|---|---|
| යාල | 184,540 | 131,650 |
| හෝටන් තැන්න | 163,007 | 47,862 |
| උඩවලව | 49,029 | 35,724 |
| වස්ගමුව | 12,450 | 589 |
| මින්නේරිය | 61,881 | 60,044 |
| බූන්දල | 5,479 | 5,003 |
| හොරගොල්ල | 3,384 | 8 |
| කවුඩුල්ල | 9,209 | 9,388 |
| ලුණුගම්වෙහෙර | 2,646 | 67 |
| ගල්ඔය | 2,456 | 292 |
| කුමණ | 13,117 | 2,945 |
| අංගම්මැඩිල්ල | 1,418 | 4 |
| ගැල්වේස්ලෑන්ඩ් | 1,191 | 54 |
| විල්පත්තු | 28,419 | 9,736 |
| මාදුරුඔය | 523 | 49 |
| ලාහුගල | 191 | 11 |
| පරෙවි දූපත් | 34,425 | 12,571 |
| හික්කඩුව | 21,693 | 5,306 |
| උඩවලව ඇත් අතුරු සෙවන | 93,061 | 15,231 |
| වැලිපර අභයභූමිය | 7,683 | 2,666 |
| **එකතුව** | **926,012** | **476,822** |

## 2014 සමස්ත මූල්‍ය ප්‍රගතිය

| මූල්‍ය ප්‍රභවය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| මූලධන වියදම් | 810.6 | 591.4 | 73 |
| පුනරාවර්තන වියදම් | 653.0 | 652.1 | 100 |
| **එකතුව** | **1,463.6** | **1,243.5** | **85** |

### වියදම් සාරාංශය (2014.12.31 දිනට)

| | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | % |
|---|---|---|---|---|
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය** | | 41 | 36.99 | 90 |
| **284-01-01-00-2001** | ගොඩනැගිලි ඉදිකිරීම් | **30** | **28.45** | **95** |
| 2001-1 | රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිත කිරීම | 30 | 0.37 | 95 |
| 2001-2 | පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය | | 6.69 | |
| 2001-3 | ජනවිහිදුම්කරණ කටයුතු සංවර්ධනය | | 3.94 | |
| 2001-4 | තර්ජනයට ලක් වූ ජීවීන් විශේෂ සංරක්ෂණය | | 2.18 | |
| 2001-5 | තොරතුරු සන්නිවේදන පද්ධති වැඩිදියුණු කිරීම | | 3.14 | |
| 2001-6 | රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම | | 1.79 | |
| 2001-7 | රක්ෂිත ප්‍රදේශවල ජල ප්‍රභවයන් වැඩිදියුණු කිරීම | | 0.19 | |
| 2001-8 | ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය | | 10.15 | |
| **284-01-01-00-2002** | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව | **3** | **0.57** | **19** |
| **284-01-01-00-2003** | වාහන | **8** | **7.97** | **100** |
| | **මූලධන වත්කම් අත්පත්කර ගැනීම** | | 37.66 | |
| **284-01-01-00-2102** | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | **18.5** | **17.74** | 96 |
| **284-01-01-00-2103** | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | **12** | **11.74** | 98 |
| **284-01-01-00-2104** | ගොඩනැගිලි ඉදිකිරීම | **27.5** | **8.17** | 30 |
| | **ඉඩම් හා ඉඩම් සංවර්ධනය** | | 320.63 | |
| **284-01-01-00-2105** | ඉඩම් හා ඉඩම් සංවර්ධනය | **459.65** | **320.63** | **70** |
| 2105- 1 | රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය | 150 | 88.05 | 59 |
| 2105- 2 | මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම | 20 | 8.33 | 42 |
| 2105- 3 | විදුලි වැට ඉදිකිරීම | 250 | 195.34 | 78 |
| 2105- 4 | රක්ෂිත ප්‍රදේශවල මායිම් සලකුණු කිරීම | 38 | 27.52 | 72 |
| 2105- 5 | වෙනත් | 1.65 | 1.38 | 84 |

| | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | % |
|---|---|---|---|---|
| **284-01-01-00-2401** | **පුහුණු හා පර්යේෂණ** | **20** | **19.98** | **100** |
| 2401-1 | පුහුණු හා පර්යේෂණ කටයුතු | 20 | 1.48 | 100 |
| 2401-2 | සංරක්ෂණ අධ්‍යයනය හා විවරණය | | 6.0 | |
| 2401-3 | ආරක්ෂාව සහ නීති ක්‍රියාත්මක කිරීම | | 4.86 | |
| 2401-4 | ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම, | | 7.64 | |
| **284-01-01-05-2104** | **හොරොවේපොතාන හා ලුණුගම්වෙහෙර වන අලි සංරක්ෂණ උද්‍යානය ස්ථාපනය කිරීම** | **30** | **24.21** | **81** |
| **284-01-01-06-2502** | දැයට කිරුළ සංවර්ධන වැඩසටහන | **2** | **1.74** | **87** |
| **284-01-01-07-2104** | **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව බල ගැන්වීම** | **200** | **150.2** | **75** |
| එකතුව | | **810.65** | **591.41** | **73** |

# ශ්‍රී ලංකා වනජීවී භාරය

# ශ්‍රී ලංකා වනජීවී භාරය

## අරමුණු

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික උරුමයන්හි පාරිසරික හා ආර්ථික අගයන් ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම
- වනජීවී හා පාරිසරික අධ්‍යාපනික කටයුතු ප්‍රචලිත කිරීම
- ශ්‍රී ලංකාවේ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය වීම
- සංරක්ෂිත කලාප ආශ්‍රිතව ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පියවර ගැනීම
- වනජීවී/ පාරිසරික නීති අවශ්‍ය පරිදි ප්‍රචලිත කිරීම
- පාරිසරික සංචාරක පහසුකම්, සන්නිවේදන කාර්යභාරයන් පවත්වාගෙන යාම හා සංවිධානය කිරීම
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික අගයන් පිළිබද ජාතික හා ජාත්‍යන්තර අවබෝධය වැඩිදියුණු කිරීම

## පරිපාලනය

වනජීවී භාරය පාලනය කරනු ලබන්නේ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් මගිනි. මෙහි සංයුතිය වනුයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නිල වශයෙන් සභාපති වශයෙන්ද, වනජීවී විෂය භාර අමාත්‍යාංශ ලේකම්තුමා, වන සංරක්ෂණ ජනරාල්, මුදල් අමාත්‍යාංශ නියෝජිත, ලංකා සංචාරක මණ්ඩල නියෝජිත, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිත, රාජ්‍ය නොවන ආයතන නියෝජිතයන් දෙදෙනෙකු හා පෞද්ගලික ව්‍යාපාරික අංශයෙන් දෙදෙනෙකු වශයෙනි.

### වනජීවී භාරයේ ආදායම් මාර්ග

වනජීවී භාරය සිය සියලු කාර්යයන් සඳහා ආදායම් ඉපයීම කළ යුතු වේ. මේ සඳහා දැනට ප්‍රධාන ආදයම් මාර්ග 4ක් හදුනාගෙන ඇත.

- අරමුදල් ආයෝජනය
- රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් කුලියට දීම
- පාරිසරික සංචාරක කටයුතු
- අලෙවි කටයුතු (සන්නිවේදන භාණ්ඩ ආදිය)

සංරක්ෂණ සේවාවන් වර්ධනය කිරීම වනජීවී භාරයෙහි වාර්ෂික ආදායම් වර්ධනය සමග බැදී පවතී.

## වනජීවී භාරයේ වැඩසටහන් හා සේවාවන්

වනජීවී භාරය තම වාර්ෂික ආදායමෙන් 50%ක් පමණ විවිධ වූ සංරක්ෂණ සේවාවන් පවත්වාගෙන යාම සඳහා වැය කරනු ලබයි.

- **ප්‍රජා අධ්‍යාපන වැඩසටහන්**

  මේ යටතේ ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගවේෂණ චාරිකා, එක්දින දැනුවත් කිරීමේ වැඩමුළු, තෙදින නේවාසික ගවේෂණ චාරිකා හා සයමාසික වනජීවී සංරක්ෂණ සහතික පත්‍ර පාඨමාලා ආදිය ඇතුළත් වේ. මෙයට අමතරව විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ද වනජීවී භාරය මගින් සංවිධානය කෙරේ.

- **පාසල් අධ්‍යාපනික වැඩසටහන් හා පාරිසරික කටයුතු**

  මෙම වැඩසටහන වනජීවී භාරයෙහි ප්‍රමුඛ වැඩසටහනකි. ඉතා වැදගත් ජෛව විවිධත්ව වටිනාකමකින් යුත් වනජීවී කලාප ආශ්‍රිත පාසල් සඳහා මෙහිදී ප්‍රමුඛත්වය ලබා දී ඇත. වනජීවී කලාප අවට ඇති පාසල්වල ක්‍රියාකාරී ගුරුවරුන් හා සිසුන් කණ්ඩායම් ඒකරාශී කරමින් ඔවුන්ගේ මූලික සහභාගීත්වය හා සැලසුම් කිරීම් යටතේ කෙටිකාලීන ක්‍රියාවන් ඉගෙනීමේ සැලසුම් හරහා මෙම වැඩසටහන් සංවිධානය කරනු ලබයි.

- **ප්‍රජා සංවිධාන ශක්තීන් දියුණු කිරීම**

  වනජීවී ආරක්ෂිත කලාප තුළ හා අවට ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාවලිය අරමුණු කරගත් සමාජානුයෝජනය දියුණු කිරීම මෙම ක්‍රියාකාරකම් වලට ඇතුළත් වේ.

- **පර්යේෂණ කටයුතු**

  මේ යටතේ අදාළ ක්ෂේත්‍රයන් තුළ විවිධ මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා සහය ලබාදීම. විශේෂයෙන්ම විශ්ව විද්‍යාල මට්ටමේ උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි අපේක්ෂක, පර්යේෂණ කටයුතු සඳහා සහය වීම හා උසස් පෙළ සිසුන් සඳහා ව්‍යාපෘති කටයුතු වලට සහය වීම සිදු කෙරේ.

- **සන්නිවේදන හා ප්‍රවෘත්ති අංශ ව්‍යාපෘතිය**

  වනජීවී භාරයෙහි අලෙවිසැල්හි ප්‍රකාශන කාර්යාංශය, ප්‍රදර්ශන අංශය හා සම්බන්ධ කාර්යයන් මීට ඇතුළත් වේ. දැනට වනජීවී භාරය මගින් තොරතුරු සන්නිවේදනය හා අලෙවි මධ්‍යස්ථාන 7 ක් ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

## 2014 වර්ෂයේ සිදුකළ වැඩසටහන්

### 01. පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන්

- ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය පිළිබඳව පාසල් සිසුන් 350ක් දැනුවත් කරමින් කොළඹ ඉසිපතන විද්‍යාලය හා ප්‍රෙස්බිටීරියන් බාලිකා විද්‍යාලයේදී දේශන පැවැත්වීම.
- සිසුන් 300 දෙනකුගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ සර්පයන් පිළිබඳව දේශනයක් අවිස්සාවේල්ල ශාන්ත මරියා මහා විද්‍යාලයේදී පැවැත්වීම.
- සිසුන් 250 දෙනකුගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ සමනලුන් පිළිබඳව දේශනයක් කොළඹ ශාන්ත මැතිව්ස් විද්‍යාලයේදී පැවැත්වීම.

### 02. පාරිසරික එක්දින වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- පාරිසරික ඡායාරූපකරණය පිළිබඳ වැඩසටහන් 2ක්, ශ්‍රී ලංකාවේ සර්පයන් පිළිබඳ වැඩසටහනක්, සමනලයන් පිළිබඳ වැඩසටහනක් හා ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය පිළිබඳ වැඩසටහනක් පැවැත්වීම

### 03. ඡායාරූප සංගමයක් පිහිටුවීම

### 04. පාසල්වල වනජීවී කව පිහිටුවීම

**05. කුලියාපිටිය, අවිස්සාවේල්ල හා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති අධ්‍යාපනික ප්‍රදර්ශන සඳහා ඉදිරිපත්වීම.**

# 2014.12. 31 දිනට ආදායම හා වියදම

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | රන්දෙනිගල | එකතුව |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආයෝජන සඳහා පොලිය | 2,876,247.00 | - | 2,876,247.00 |
| සංචාරක බංගලා | 802,650.00 | 1,112,019.50 | 1,914,669.50 |
| සංචාරක නිකේතන | - | 1,708,112.50 | 1,708,112.50 |
| දේශන ශාලාව | - | 99,725.00 | 99,725.00 |
| අලෙවි මධ්‍යස්ථාන | - | 115,300.00 | 115,300.00 |
| බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ අලෙවි කුටි වලින් ලද ආදායම | 622,170.00 | - | 622,170.00 |
| වෙනත් | - | 24,236.29 | 24,236.29 |
| පුහුණු වැඩසටහන් | 25,800.00 | - | 25,800.00 |
| අලෙවි කවුළු වලින් | 1,725,672.50 | 102,490.00 | 1,828,162.50 |
| ණය පොලී | 4,641.00 | 10,920.00 | 15,561.00 |
| ටෙන්ඩර් අයදුම්පත් වලින් ලද ආදායම | 1,500.00 | - | 1,500.00 |
| දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය | 311,620,.00 | - | 311,620.00 |
| කාර්යාල උපකරණ අලෙවියෙන් ලද ආදායම | 26,450.11 | - | 26,450.11 |
| බදු කුලී - යාල හා හෝර්ටන් තැන්න | 1,625,000.00 | - | 1,625,000.00 |
| අලෙවි මධ්‍යස්ථානවල තැන්පතු | 30,000.00 | - | 30,000.00 |
| **එකතුව** | **8,051,750.61** | **3,172,803.29** | **11,224,553.90** |
| **වියදම** | | | |
| පුවත්පත් | 10,040.00 | - | 10,040.00 |
| ගමනාගමන දීමනා | 48,463.10 | - | 48,463.10 |
| සුළු මුදල් | 15,528.00 | 110,420.00 | 125,948.00 |
| ඉන්ධන | 99,000.00 | 73,500.00 | 172,500.00 |
| වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | 84,070.00 | 30,657.50 | 114,727.50 |
| උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 22,855.24 | - | 22,855.24 |
| මිලදී ගැනීම් | 1,826,532.50 | - | 1,826,532.50 |
| දැන්වීම් හා ප්‍රචාරණය | 11,000.00 | - | 11,000.00 |
| කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | - | 4,700.00 | 4,700.00 |
| ගොඩනැගිලි සඳහා යන වියදම | - | 22,920.00 | 22,920.00 |
| දුරකථන | 41,374.68 | 37,113.09 | 78,487.77 |
| ජලය | - | 153,180.00 | 153,180.00 |
| වැටුප් හා දීමනා | 3,264,350.47 | 4,644,016.89 | 7,908,367.36 |
| විදුලිය | 2,693.63 | 278,590.33 | 281,283.96 |
| තැපැල් | 11,280.00 | - | 11,280.00 |
| සංචාරක නිකේතන | - | 571,461.00 | 571,461.00 |
| ගබඩා භාණ්ඩ | 20,284.00 | - | 20,284.00 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩසටහන් | 17,420.50 | - | 17,420.50 |

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | රන්දෙනිගල | එකතුව |
|---|---|---|---|
| **වියදම** | | | |
| පාරිතෝෂික | 1,275.50 | - | 1,275.00 |
| පොත් ප්‍රදර්ශන | 504,362.50 | - | 504,362.50 |
| දැයට කිරුළ වැඩසටහන | 158,220.81 | - | 158,220.81 |
| මුදල් හුවමාරු කිරීමේ බදු (මහජන බැංකුව) | 5,142.60 | - | 5,142.60 |
| අවසන් ගිණුම් සකස් කිරීම සඳහා ගෙවීම් | 400,000.00 | - | 400,000.00 |
| කුලී ගෙවීම් | 800,000.00 | - | 800,000.00 |
| වෙනත් | 38,829.00 | 13,205.24 | 52,034.24 |
| එකතුව | **7,382,722.03** | **5,939,764.05** | **13,322,486.08** |